ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 18 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වශයෙන් ගිණුම්ගත විය යුතු රු.42,577,845 ක් වූ යන්ත්‍ර 02 ක වටිනාකම මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් කට්ටි කිරීම් පිළිබඳ තොරතුරු අනුව සභාවට ඔප්පු මඟින් පවරා ඇති රු.10,190,000 ක් වටිනා ඉඩම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු සමාලෝචිත වර්ෂයේ දායක මුදල වන රු.112,861 ක මුදල වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොකිරීමේ හේතුවෙන් වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයේ තෙවන හා සිව්වන කාර්තු වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල වෙත ගෙවූ රු.173,933 ක පොලී හා රු.526,436 ක ණය වාරික, ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර වියදම් යටතේ ගිණුම්ගත කිරීම මත වර්ෂයේ වියදම රු.700,369 කින් හා දිගු කාලීන වගකීම් රු.526,436 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් කාර්තු 03 වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල වෙත ගෙවූ රු.467,760 ක පොලී මුදල් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ගිණුම හර කිරීම මත වර්ෂයේ වියදම් හා ණය හිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.1,637,165 ක උසාවි දඩ ශේෂයට 2014 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද රු.2,025,174 ක හිඟ උසාවි දඩ මුදල බැර කිරීම නිසා හිඟ උසාවි දඩ ශේෂය රු.388,009 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2014 නොවැම්බර් 15 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මත බඳවාගත් සේවකයින් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.8,387,131 කින් වැටුප් ප්‍රතිපූර්ණ මුදල් හිඟ වැටුප් ලෙස ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණය ගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් දුන් වට්ටම් රු.57,140 ක මුදල වියදම් ගිණුම හර කළ යුතු වුවද, එය ජර්නල් 46 මගින් ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායක වීමේ ගිණුම හර කිරීම මත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ රු.1,806,106 ක් වූ විවිධ ණයහිමි ශේෂය වෙනුවට රු.4,304,106 ක් ගෙවීම් ලෙස ගිණුම හර කිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට පැවතිය යුතු ණයහිමි ශේෂය රු.2,498,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් ලද රු.21,299,179 ක් වටිනා වාහනයේ අගය ප්‍රාග්ධන ආදායම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල රු.11,286,212 ක් වූ කර්මාන්ත ණයහිමියෝ රු.10,448,241 ක් ලෙස ගිණුම්ගත කිරීම මත වර්ෂයේ වියදම් හා ණය හිමියන් රු.837,971 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය තුළ බදු කුලී හිඟ වාරික සඳහා හිලව් කළ රු.375,005 ක ආරක්ෂිත ඇප මුදල් ජර්නල් සටහන් 78 මඟින් සමුච්චිත අරමුදලට බැර කිරීම මත ආරක්ෂික ඇප තැන්පත් රු.375,005 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් කට්ටි කිරීම්වලට අදාලව ලැබිය යුතු රු.897,966 ක් වූ සියයට 1 ක බදු මුදල රු.621,619 ක් ලෙස ගිණුම්ගත කිරීම මත වර්ෂයේ ආදායම හා ණය ගැතියන් රු.276,347 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂය තුළ කඩ කාමර, පෙර ගෙවුම් මුදල් වශයෙන් ලද රු.1,657,827 ක මුදල මිශ්‍ර තැන්පත් වශයෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(න) 2014 වර්ෂය තුළ ලද රු.1,578,840 ක පෙර ගෙවුම් මුදල් කොන්ත්‍රාත් තැන්පත් යටතේ දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ශේෂය හා ඊට අනුරූපී, උපයෝගී ලේඛනවල ශේෂය අතර රු.45,236 ක නොසැසඳීමක් පැවතුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 53,509,450 ක් වූ අතර එයින් රු.5,695,162 ක ශේෂයක් වසර 03 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂයන් විය.

(ii) ලැබිය යුතු ගිණුම් තුළ දීර්ඝ කාලයක සිට පවතින තොරතුරු ඉදිරිපත් නොවූ රු.4,379,757 ක හිඟ බදු කුලී ශේෂයක්ද 2014 වර්ෂයට අදාල රු.5,068,753 ක කර්මාන්ත ණයගැති ශේෂයක් හා රු.25,286,306 ක හිඟ මුද්දර ගාස්තු ශේෂයක්ද පැවතුණි.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

(i) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 40,214,538 ක් වූ අතර එයින් රු.697,905 ක ශේෂයක් වසර 03 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොමැති ශේෂයන් විය.

(ii) ගෙවිය යුතු ගිණුම් තුළ දීර්ඝ කාලයක සිට පවතින පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.4,658,738 ක ශේෂයක්ද 2014 ට පෙර සිට පවතින ගෙවිය යුතු රු.555,488 ක එකතු කළ අගය මත බදු ශේෂයක් හා 2013 හා 2014 වර්ෂවලට අදාල රු.5,195,580 ක කර්මාන්ත ණයහිමි ශේෂයක්ද පැවතුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.3,086,417 ක් වූ විවිධ තැන්පතුවලට අදාළව තැන්පත් ලේඛන/උපලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගිණුම් විෂයය පිළිබඳව සතුටුදායක පරීක්ෂාවක් කළ නොහැකි විය.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,220,563 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.8,965,427ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,185,990 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.90,478,790 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.92,007,355 ක් වූ ප්‍රාග්ධන වියදම් ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.7,691,998 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | | ආදායම | | | | වියදම | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | 2015 | 2014 | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) උත්පාදිත ආදායම | 24,841 | 17,673 | 7,168 | පෞද්ගලික පඩිනඩි | 70,356 | 52,762 | 17,594 |
| (ii) වෙනත් | 95,983 | 60,990 | 34,993 | අනෙකුත් | 41,247 | 34,867 | 6,380 |
| උප එකතුව | 120,824 | 78,663 | 42,161 | උප එකතුව | 111,603 | 87,629 | 23,974 |
| (iii) ප්‍රාග්ධන ආදායම | 90,478 | 27,617 | 62,861 | ප්‍රාග්ධන වියදම | 92,007 | 10,550 | 81,457 |
| මුළු එකතුව | 211,302 | 106,280 | 105,022 | මුළු එකතුව | 203,610 | 98,179 | 105,431 |
| මෙහෙයුම් ප්‍රතිඵලය | 9,221 | (8,965) | 18,186 | අතිරික්තය/ ඌනතාවය | 7,692 | 8,101 | (409) |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.120,824,008 න් සියයට 79 ක් හෙවත් රු.95,982,383 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.90,478,790 ක මුළු ප්‍රමාණයම වෙනත් ආයතන මගින් සභාබල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.111,603,445 න් සියයට 63 ක් හෙවත් රු.70,355,855 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 81 ක් හෙවත් රු.57,152,519 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආධාර යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.92,007,354 න් සියයට 19 ක් ලෙස රු.17,714,815 ක් සභා අරමුදලින් වැය කර තිබූ අතර ඉතිරි සියයට 81 ක් වූ රු.74,292,539 ක ප්‍රමාණය දින 100 වැඩ සටහන, පළාත් සභා කර්මාන්ත, පළාත් ආයෝජන වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

## 2.3 <u>ආදායම් පරිපාලනය</u>

### 2.3.1 <u>ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය</u>

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 4,500 | 6,005 | 5,218 | 3,000 | 3,244 | 4,514 |
| (ii) | බදුකුලී | 10,000 | 10,101 | 4,819 | 7,500 | 8,361 | 3,875 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,050 | 1,993 | - | 1,400 | 1,818 | - |
| (iv) | වෙනත් ආදායම් | 91, 231 | 102,725 | 26,876 | 65,201 | 65,240 | 24,339 |
| | එකතුව | 107,781 | 120,824 | 36,913 | 77,101 | 78,663 | 32,728 |

## 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | ආදායම් රැස් කිරීම<br>2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | හිඟහිටි ශේෂය<br>2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 |
| වරිපනම් හා බදු | 4,514 | 6,005 | 10,519 | 1,078 | 4,223 | 5,301 | 3,436 | 1,782 | 5,218 |
| බදු කුලී | 3,875 | 10,100 | 13,975 | 132 | 9,024 | 9,156 | 3,743 | 1,076 | 4,819 |
| බලපත්‍ර ගාස්තු | - | 1,992 | 1,992 | - | 1,992 | 1,992 | - | - | - |
| වෙනත් ආදායම් | 24,339 | 102,723 | 127,062 | 24,658* | 75,847 | 100,505 | - | 26,876 | 26,876* |
| එකතුව | 32,728 | 120,820 | 153,548 | 25,868 | 91,086 | 116,954 | 7,179 | 29,734 | 36,913 |

* උසාවි දඩ 2015 ජනවාරි 01 දිනට හිඟ ශේෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම මත රු.319,000 ක් සමාලෝචිත වර්ෂය තුළ වැඩියෙන් ලැබී ඇත.

## 2.3.3 කඩ කුලී

තක්සේරු වටිනාකම රු.8,565,263 ක් වූ මැල්සිරිපුර බස් නැවතුම්පොල කඩ කාමර 07 ක් රු.8,566,859 ක පෙර ගෙවුම් මුදලකට පෙර ගෙවුම් (කීමනී) ක්‍රමයට ලබාදී තිබූ අතර ඒ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) මීට අදාළව පොදු ලිපිගොණුව ක්‍රමානුකූලව නඩත්තු කර නොතිබූ අතර කඩ කාමර ලබාදුන් පදනම, මුදල් ගෙවිය යුතු ආකාරය හා ඊට අදාළ අනෙකුත් ප්‍රමාණවත් තොරතුරු විගණනයේදී හඳුනා ගැනීමට නොහැකි විය. එමෙන්ම එක් එක් කඩ කාමරය සඳහා වෙනම ලිපිගොණු පැවතියද, ප්‍රමාණවත් තොරතුරු එම ලිපිගොණුවල ගොණුකර නොතිබූ අතර අදාළ පාර්ශව සමඟ කිසිදු ගිවිසුමකටද එළඹ නොතිබුණි.

(ආ) කඩ කාමර හඳුනාගත හැකිවන පරිදි අංක කර නොතිබූ අතර ටෙන්ඩර් මඟින් කඩ කාමර 07 ක් සඳහා මුදල් අයකර තිබුණද, කඩ කාමර බදුගත් බදුකරුවන් පිළිබඳ තොරතුරු සභාව සතුව නොතිබුණි.

(ඇ) 2013 අප්‍රේල් 30 දක්වා වූ ටෙන්ඩර් කැඳවීම් කොන්දේසි අනුව ටෙන්ඩර් මුදලින් සියයට 50 ක් දින 14 ක් ඇතුළත හා ඉතිරි සියයට 50 මාස 6 ක් ඇතුළත වාරික වශයෙන් ගෙවිය යුතු වුවද, පෙර ගෙවුම් මුදල් ලෙස සභාවට අයවිය යුතු රු.5,330,191 ක මුදලක් අය කරගෙන නොතිබුණි.

(ඈ) ඉහත කඩ කාමරවලට අමතරව මැල්සිරිපුර බස් නැවතුම්පොළ වර්ග අඩි 153 බැගින් වූ කඩ කාමර 04 ක් ඉදිකර තිබූ අතර මෙම කඩ කාමර නිමකර මාස 15 කට වැඩි කාලයක් ගත වුවද, එම කඩ කාමර තක්සේරු කර පෙර ගෙවුම් ක්‍රමයට හෝ කුලියට ලබාදීම සඳහා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.3.4 <u>බදු කුලී</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වත්කම් බදු දීම සඳහා ඉදිරිපත් කල දේපල ලැයිස්තු අනුව 2011 වර්ෂයේ සිට බදු නොදුන් දේපල 05 ක්ද, 2012 වර්ෂයේ සිට බදු නොදුන් දේපල 02 ක් හා 2014 වර්ෂයේ සිට බදු නොදුන් දේපල 02 ක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව මස් මාළු අලෙවි ස්ථාන සඳහා වෙලඳ බලපත්‍ර ලබාගෙන තිබුණද එකී වත්කම් සභාවේ අයිතිය බදු දීම් යටතට ගෙන බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වත්කම් බදු දීම් වලට අදාළව වත්කම් 02 ක් වෙනුවෙන් අයවිය යුතු රු.340,299 ක හිඟ වාරික හා ඊට අදාළ රු.34,029 ක දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.5 <u>බලපත්‍ර ගාස්තු</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දුරකතන සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපිත කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර ලබාගෙන ඉදි කිරීමෙන් පසු අනුකූලතා සහතික ලබාගත යුතු වුවද, 2013 වර්ෂයෙන් පසු කිසිදු දුරකතන සමාගමක් විසින් අනුකූලතා සහතික ලබා ගැනීම සඳහා අයදුම් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදන අනුව ස්ථාපිත කර තිබූ කුළුණු වලට අදාලව උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් සහ වැඩිවන සෑම මීටර් එකකටම රු.100 බැගින් වූ ගාස්තු අයකර නොතිබුණි.

එමෙන්ම කුළුණු සඳහා වාර්ෂිකව අයකල යුතු ව්‍යාපාර බදු අය කිරීම හෝ වෙලඳ බලපත්‍ර ලබාදීමක් සිදුව නොතිබුණි.

### 2.3.6 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් තුල දැන්වීම් පුවරු හා බැනර් ස්ථාපිත කර තිබුණද, 2014 නොවැම්බර් මස 28 දිනැති අංක 1891 දරන ගැසට් නිවේදනයේ දක්වා ඇති විධිවිධාන අනුව බිත්තියක්, පුවරුවක්, රෙදි හෝ පොලිතින් යොදාගෙන කරනු ලබන ප්‍රචාරක දැන්වීම් වර්ග අඩියක් සඳහා රු.50 බැගින් ගාස්තු අයකළ හැකි වුවද, සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු 38 ක් හඳුනාගෙන තිබුණද පුවරු 12 ක් සඳහා පමණක් ගාස්තු අයකර තිබුණි.

### 2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.802,877 ක් වූ අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු.25,286,306 ක්ද විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඉඩම් කට්ටි කර විකිණීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ අනුබෙදීම් කරන ලද ඉඩම් කට්ටියකට අදාලව අයකර තිබූ සියයට 1 ක බදු මුදල සඳහන් කර නොතිබූ අතර කට්ටි 03 කට අදාලව බදු මුදලින් කොටසක් පමණක් අයකර තිබුණි. එමෙන්ම ඉඩම් කට්ටි 02 කට අදාලව පොදු පහසුකම් සඳහා වෙන්කර තිබූ ඉඩමේ ඔප්පු අංක හා ප්‍රමාණයන් සඳහන් කර නොතිබුණි.

(ආ) 2003 නොවැම්බර් 28 දිනැති අංක 1317 දරන පළාත් සභා ගැසට් පත්‍රයේ නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටි කිරීම සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවේ10 ජේදයේ (1) ප්‍රකාරව ඉඩම් කට්ටි සංඛ්‍යාව 20 ට වැඩි වන විට පාරේ පළල මීටර් 09 ක් විය යුතු වුවද, ඉඩම් කට්ටි 20 ට වැඩි නමුත් පාරේ පළල මීටර් 06 ක් පමණක් වූ කට්ටි සැලසුම් 12 ක් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අනුමත කර තිබුණි.

(ඇ) අක්කර 03 රූඩ් 02 පර්චස් 5.7 ක් වූ නින්ද පැල්ල උඩවලේ වත්ත ඉඩමෙහි පොදු කොටස සඳහා වෙන්කල කොටස හඳුනා ගැනීමට නොහැකි විය. මාර්ග වල පළල මීටර් 06 ක් පමණක් වූ අතර මාර්ග දෙපස කාණු පද්ධතිය නොතිබුණු බැවින් මාර්ගය හරහා ජලය ගලා යන බව 2015 ඔක්තෝබර් 22 දින කරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද විදුලිය සහ ජල පහසුකම් සැපයීමක් සිදුකර නොතිබුණි.

(ඈ) 2015 මාර්තු 02 දින කට්ටි සැලැස්ම අනුමත කර තිබුණු පාන්ගොල්ල ගොල්ලන් පහුව වතුයාය නැමැති ඉඩමෙහි කට්ටි 49 ක් විය. පොදු කොටස සඳහා කට්ටි අංක 42 මගින් රූඩ් 01පර්චස් 38.5 ක් වෙන්කර තිබුණු අතර එය හඳුනා ගැනීම හෝ වෙනත් අයගේ භාවිතයෙන් වලක්වා ගැනීමට නිශ්චිත වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි. පොල්ගස් 20ක් පමණ එහි තිබූ අතර එම ඵලදාව බදු දීමට කටයුතු කර නොතිබුණි. විදුලිය සපයා නොතිබුණු අතර ඉඩම් කට්ටි සඳහා ජල නල එලා ජල පහසුකම් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

හිරිපිටිය උප කාර්යාලයට අයත් කපුහේන වත්ත නැමැති ඉඩමේ වූ සභාව සතු අක්කර 3 ක් පමණ විශාල පොදු ඉඩම ස්ථාවර වත්කම් ලේඛණයේ සටහන් කර නොතිබුණු අතර 2015 ඔක්තෝබර් 22 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අදාල ඉඩමේ කොටසක් බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් ස්ථිර බෝග වගා කර තිබුණු නමුත් ඒ සඳහා සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 3.3 වාහන පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (ආ) සහ (ඇ) අනුව ක්‍රමවත්ව හා විධිමත් ලෙස දෛනික ධාවන සටහන් නඩත්තු කළ යුතු වුවත් අංක PD-1844 දරන කැබ් රථයේ දෛනික ධාවන සටහන් 2012 සැප්තැම්බර් 06 දින සිට 2015 ඔක්තෝබර් 20 විගණන දිනය දක්වා ලියා නොතිබුණි. එකී කාලයට අදාලව කැබ් රථය ධාවනය වූ කි.මී. ගණන 149236 ක් වූ අතර ඒ සඳහා ඉන්ධන වියදම් ලෙස රු.2,928,855 ක් ද, නඩත්තු වියදම් ලෙස රු.461,565 ක්ද වශයෙන් එකතුව රු.3,390,420 ක් දරා තිබුණි.

(ආ) මෙකී වාහනයට අදාල රියදුරු 2012 නොවැම්බර් 01 දින සිට 2015 මැයි 15 දින දක්වා, 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර හෝ පැමිණීමේ ලේඛණය මගින් හෝ ඔහුගේ රාජකාරියට පැමිණීම සනාථ කරගෙන නොතිබුණි. එමෙන්ම දෛනික ධාවන සටහන්ද ඉදිරිපත් කර නොතිබුණි. එකී කාලයට අදාලව වැටුප් හා දීමනා රු.723,140 ක්ද ගමන් වියදම් හා සංයුක්ත දීමනා රු.87,662 ක්ද අතිකාල දීමනාව ලෙස රු.89,250 ක්ද වශයෙන් රු.900,052 ක් ඔහුගේ පැමිණීම සහ සිදුකල රාජකාරිය සනාථ කර ගැනීමකින් තොරව ගෙවා තිබුණි.

(ඇ) කාර්යාලීය නිලධාරියෙකු ඉදිරියේ විධිමත් ඉන්ධන ඇනවුමක් ඉදිරිපත් කර ඉන්ධන ලබා ගැනීම සිදුකල යුතු වුවද රියදුරු විසින් එවැනි අධීක්ෂණයකින් හා අනුමැතියකින් තොරව එකී වාහනයට පුද්ගලික පිරවුම්හලකින් 2013 ජූලි 13 දින සිට 2013 සැප්තැම්බර් 04 දින දක්වා රු.176,225 ක් වටිනා ඉන්ධන ලීටර් 1466 ක් ලබා ගෙන තිබුණි.

### 3.4 කිරිගව පාලනය

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ අයවැය යෝජනා - 2013, පළාත්වල දිළිඳුකම අවම කිරීමේ සංවර්ධන වැඩ සටහන වයඹ පළාත් කිරිගව පාලනය නැමැති උපදෙස් ලිපියේ ඇමුණුම් අංක 02 හි 01 වගන්ති ප්‍රකාරව කිරිගවයෙකු සඳහා සියයට 20 ක ප්‍රතිලාභී දායකත්වයක් ලබාගත යුතු බව දක්වා තිබුණි. එහෙත් සභාව විසින් ලබාදී තිබූ කිරිගවයින් 05 කට අදාළව ලබාගත යුතු රු.57,000 ක ප්‍රතිලාභී දායකත්වය අදාළ ප්‍රතිලාභීන්ගෙන් ලබා නොගෙන අදාළ සතුන්ගේ මුළු වියදම සභාව විසින් දරා තිබූ අතර ප්‍රතිලාභීන් 03 දෙනෙකුගෙන් පමණක් සියයට 20 ක මුදල ලබාගෙන තිබුණි.

(ඇ) සභාව විසින් රු.55,000 සිට රු.100,000 දක්වා වූ විවිධ වටිනාකම් වලින් කිරි ගවයින් මිළදී ගෙන තිබුණද අදාළ සතුන් රක්ෂණය කිරීමේදී රක්ෂණ සමාගමේ තක්සේරුව රු.25,000 සිට රු.65,000 දක්වා වූ පරාසයක පැවතිණි. ඒ අනුව සභාව විසින් සතුන් සඳහා ගෙවා ඇති වටිනාකම් පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරී වී තිබුණි. තවද මෙසේ වැඩි මුදලක් ගෙවා මිලදීගත් සතුන්ගේ රක්ෂිත මුදල ඊට අඩු වටිනාකමක්වීම මත රු.100,000 ක් වැයකර මිළදී ගත් අංක 6130/0224/0069 දරන කිරි ගවයා 2015 මාර්තු 27 දින මිය යෑම හේතුවෙන් රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබුනේ රු.62,000 ක් පමණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.5.1 මාර්ගවල බොරළු ඇතිරීම

2014 හා 2015 වර්ෂවල පොදු අරමුදල් භාවිතා කර සිදුකර තිබුණු කර්මාන්ත 225 න් කර්මාන්ත 198 ක් හෙවත් සියයට 88 ක්ම බොරළු දැමීම වූ අතර ඒ සඳහා වැයකල මුදල රු.21,536,410 ක් විය. සමාලෝචිත වර්ෂයේ මාර්ග 5 ක් සම්බන්ධයෙන් 2015 ඔක්තෝබර් 23 දින කරන ලද නියැදි පරීක්ෂාවේදී මෙම මාර්ගවල බොරළු සෝදාගෙන ගොස් වලවල් සෑදී තිබූ බව නිරීක්ෂණය විය.

### 3.5.2 නාබැට ජල ව්‍යාපෘතිය

2012 වර්ෂයේ වැඩ ආරම්භ කර ඇති දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පැවති නාබැට ජල ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේ ජලය රැස් කර තැබීම සඳහා ටැංකියක් සකස් කිරීමට රු.1,336,545 ක් වැයකර තිබුණි. 2015 ඔක්තෝබර් 23 විගණන අවස්ථාව වන විට අදාල ජල ටැංකිය පතුලින් ජලය කාන්දු වෙමින් පැවතුණි. 2014 වර්ෂයේ නාබැට ජල ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් සඳහා 2 වන කොටස් ගෙවීම යටතේ අනු අංක 04 මගින් අඟල් 4 GI නල සපයා සවි කිරීම සඳහා දිග් අඩියකට රු.662 බැගින් දික් අඩි 45 වෙනුවෙන් රු.29,790 ක් ගෙවා තිබුණි.

### 3.5.3 හිරිපිටිය උප කාර්යාලයේ වාහන නවතා තැබීම සඳහා ආවරණ මඩුවක් ඉදි කිරීම. රු.164,816.33

යථෝක්ත කර්මාන්තයට අදාල ගෙවීම් වාර්තාවේ විෂය අංක 03 මගින් 1:2:4 ($^3/_4$)" සිමෙන්ති කොන්ක්‍රීට් මිශ්‍රණයේ කුළුණු පාදම කොන්ක්‍රීට් කිරීම සඳහා කියුබ්.66 ක් සඳහා රු.22,874 ක් ගෙවා තිබුණු අතර යොදන ලද කොන්ක්‍රීට් නිසි ප්‍රමිතියෙන් තොර වූ බැවින් කැඩෙන සුළු විය. තවද වහලයේ වූ GI තහඩු සමහරක් ගැලවී බිම වැටී තිබූ අතර වහලයේ කෙලවර හා මැද කොටසේ තහඩු සුළං පාරට ඉරී එල්ලෙමින් පැවතුණි. භාවිතා කර තිබුණු තහඩු ගේජ් 34 වූ අතර තහඩු වල ඝණකම සම්බන්ධයෙන් ගෙවීම් වාර්තාවේ හෝ ඇස්තමේන්තුවේ සඳහන් කර නොතිබුණි. භාවිතා කර තිබුණු පොල් යටලී, පොල් පරාල හා රීප්ප වල දැව ආරක්ෂක තීන්ත දෙවරක් ආලේප කර නොතිබුණු අතර තහඩු ඉවත්ව තිබුණු ස්ථානවල ලී සුදු පැහැතිව පුස් බැඳ දිරා තිබුණි.

## 3.6 හඳුනාගත් අලාභ

2014 නොවැම්බර් 10 දින පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද GI බට 600 සම්බන්ධයෙන් 2015 ඔක්තෝබර් 25 දින කරන ලද භෞතික පරික්ෂාවේදී බට 183 ක ඌණතාවයක් අනාවරණය විය.

## 04 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

## 4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛන අනුව වැය විෂයයන් 02 ක් යටතේ ඇස්තමේන්තුගත වියදම රු.10,970,000 ක් වුවත් සත්‍ය වියදම රු.31,421,000 ක් වූයෙන් රු.20,451,000 කින් අයවැය ලේඛනයේ ඉක්මවීම් පැවතුණි.

(ආ) සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කර අයවැය ලේඛන මඟින් ප්‍රතිපාදන වෙන්කර තිබූ රු.200,000 ක් වටිනා සුභ සාධන කාර්යයන් 03 ක් ඉටුකර නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂයට අදාලව විගණන හා කළමනාකරණ කමිටුව රැස්වී නොතිබූ අතර ඒ යටතේ වූ අභ්‍යන්තර විගණන ඒකකයද ක්‍රියාත්මක වී නොතිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

### 4.3.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ රු.31,500 ක් වැයකර සභාව විසින් මිලදීගෙන තිබූ කලර් ප්‍රින්ටර් එකක් මිලදී ගත් දින සිටම අදාල කාර්යයන්ට භාවිතා කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් සභාවට කූඩාරම් 12 ක් ලබා දී තිබූ අතර 2014 වර්ෂයේ මෙම කූඩාරම් සඳහා අළුතින් කූඩාරම් රෙදි මිලදී ගැනීම සඳහා රු.90,000 ක් සභා අරමුදලින් වැයකර තිබුණි. මෙම කූඩාරම් රෙදි ද කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා තිබූ අතර දිරාපත් වී තිබුණි.

**05** **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය